# වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

## ආපනශාලාව සහ ඡායා පිටපත් සේවාව පවත්වාගෙන යාම

**පහත දැක්වෙන අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් රත්මලාන, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.**

| Tender No | Tasks Description | Bid Security (Rs.) | Non-refundable Fee (Rs.) |
|---|---|---|---|
| 20/UVT/SUP/NCB//CS/01 | වසරක කාලයක් සඳහා ආපනශාලාව පවත්වාගෙන යාම | 15,000.00 | 1,000.00 |
| 20/UVT/SUP/NCB//PS/01 | වසරක කාලයක් සඳහා ඡායා පිටපත් සේවාව පවත්වාගෙන යාම | 15,000.00 | 1,000.00 |

1. ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය යටතේ පැවැත්වේ.
2. අභිලාෂී ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයෙන් (දුරකථන අංකය - 011-2630733) ලබා ගත හැකි වන අතර, ලංසු ලිපි ලේඛණ 2020.09.16 වන දින සිට 2020.10.06 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා පරීක්ෂා කළ හැක.
3. අභිලාෂී ලංසුකරුවන්හට ලංසු ලිපි ලේඛණ කට්ටලය අදාළ ආපසු නොගෙවනු ලබන ගාස්තු ගෙවීමෙන් අනතුරුව සහකාර මූල්‍යාධිකාරී (සැපයුම්), වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2020.09.16 වන දින සිට 2020.10.06 වන දින දක්වා වැඩ කරන දිනයන්හි පෙ.ව 9.00 සිට ප.ව. 2.00 දක්වා ලබාගත හැක.
4. අනුපිටපතකින් යුතු ලංසු (මුල් පිටපත හා අනු පිටපත) 2020.10.07 වන දින ප.ව. 2.00 ට පෙර සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, අංක 100, කඳවල රත්මලාන යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ විශ්වවිද්‍යාලීය සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුළ තැන්පත් කළ යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි "ප්‍රසම්පාදන අංකය, ප්‍රසම්පාදනයේ විස්තර, ලංසුපත් විවෘත කිරීමේ දිනය" සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
5. 2020.10.07 වන දින ප.ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ අධිකාරී බලයලත් නියෝජිතයෙකුට (බලය පවරන ලද ලිපිය සමඟ) සහභාගි විය හැක.
6. ඕනෑම අවස්ථාවක ඇති එක් ලංසුවක් හෝ ලංසු කිහිපයක් හෝ ලංසු සියල්ල භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ හිමිකම විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව සතුය.


**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය,**
**අංක 100, කඳවල,**
**රත්මලාන.**

Tel: 0112630733
Fax: 0112630738
Web: www.univotec.ac.lk


**2020 සැප්තැම්බර් 16.**